# ගොවි සංවිධාන වලට අත් ට්‍රැක්ටර්

*එන්. එස්. බී. ඇපාකන්ද (සංඛ්‍යාන සහකාර)*
පුහුණු අංශය, ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය.

**ගොවීන් සංවිධානය වීම තුළින් දැනට පුද්ගලිකව ලබන ආර්ථික වාසිවලට වඩා වැඩි වාසියක් ලබා ගැනීමට ඔවුනට හැකියාවක් ලැබේ . දැනට ලංකාවේ පිහිටුවා ඇති සාර්ථක ගොවි සංවිධාන වල ක්‍රියාකාරිත්වය තුළින් මෙය අපට පැහැදිලිව පෙනී යයි . යෙදවුම් හා සේවාවන් සඳහා වන වියදම දිනෙන් දින ඉහළ යාම ගොවීන් මුහුණ පාන ප්‍රධාන ගැටළුවකි . බිම් සකස් කිරීමේ කටයුතු සඳහාත් . ප්‍රවාහන කටයුතු සඳහාත් ගොවීන් පෞද්ගලික ට්‍රැක්ටර් හිමියාගෙන් ට්‍රැක්ටර් ලබාගැනීමේ දී ඒ සඳහා ඔවුනට ගෙවීමට සිදුවන කුලිය අධික වේ . මේ ගැටළුවට ගොවීන් තනි තනිව විසඳුම් සොයනවාට වඩා සංවිධානය වීම තුළින් විසඳුම් සෙවීම ඵලදායි බව සාර්ථක ගොවි සංවිධාන රාශියක ක්‍රියාකාරිත්වය තුළින් මනාව ඔප්පු වේ . පොහොර කෘෂි රසායන වැනි යෙදවුම් සංවිධාන විසින් මිලට ගෙන සුළු ලාභයක් සහිතව අලෙවි කිරීමේ ක්‍රම දැනටමත් ගොවි සාංවිධාන සාර්ථකව සිදු කරයි . මෙමගින් විවෘත වෙළඳපොලේ මිලට වඩා අඩුවෙන් එම යෙදවුම් ගොවීනට ලබාදීමට ගොවි සංවිධාන මගින් පියවර ගෙන ඇත**

ගොවි සංවිධානය සතු ට්‍රැක්ටරයක් තිබීම , ට්‍රැක්ටර් සඳහා ගොවීනට වැයවන අධික වියදම අඩු කර ගැනීමට හැකි පහසුම ක්‍රමය වේ . ගොවි සංවිධානයන්ට ට්‍රැක්ටර් ලබාදීම සඳහා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව මගින් දැනටමත් වැඩ පිළිවෙලක් ආරම්භ කර ඇත මෙය ජපන් රජයෙන් ලද ආධාර මුදලක් යටතේ ක්‍රියාත්මක වන වැඩ සටහනකි . 1992 වසරේදී ආරම්භ කරන ලද මෙම වැඩ පිළිවෙල තුළින් දැනටමත් ගොවි සංවිධාන රාශියක් ඵල ප්‍රයෝජන ලබාගෙන ඇත .

මේ වැඩ පිළිවෙල යටතේ 1992 වර්ෂය තුළදී ගොවි සංවිධාන 99 ක් කුබෝටා වර්ගයේ රෝද දෙකේ ට්‍රැක්ටර් 99 ක් ද , 1993 වර්ෂයේ මේ දක්වා ගොවි සංවිධාන 330 ක් යන්මාර් වර්ගයේ රෝද දෙකේ ට්‍රැක්ටර් 330 ක් ද ලබාගෙන ඇත . මෙම වර්ෂයේ ඉදිරි කාලය තුළ බෙදාදීමට ට්‍රැක්ටර් 200 ක් දැනටමත් ආනයනය කර ඒ සඳහා සුදුසු ගොවි සංවිධාන තෝරා ගැනීම මේ දිනවල සිදුකර ගෙන යනු ලබයි .

යම් ගොවි සංවිධානයකට ට්‍රැක්ටරයක් ලබාගැනීම සඳහා විශාල මුදලක් අවශ්‍ය නොවේ . එම ට්‍රැක්ටර් සහන මිල ක්‍රමයක් යටතේ දෙනු ලබයි . තවත් මෙහි විශේෂත්වයක් වන්නේ කොටස් වශයෙන් ගෙවීමේ පහසුකම් ද සලසා තිබීමයි .

**1992 , 1993 වර්ෂ තුළදී ලබාදුන් ට්‍රැක්ටර් වල වටිනාකම් හා ගෙවීම් පදනම පහත සඳහන් සටහනෙන් පැහැදිලි වේ .**

| ට්‍රැක්ටරයේ වර්ගය | වටිනාකම | ගොවි සංවිධාන වලට ලබාදුන් සහන මිල රු | ගෙවිය යුතු මූලික මුදල රු | මාසික වාරික 35 කින් වාරිකය රු | මාසික වාරික 47 කින් වාරිකය රු |
|---|---|---|---|---|---|
| කුබෝටා | 203129/- | 115145/- | 9750/- | 3011.50 | 2242.50 |
| යන්මාර් | 165000/- | 95000/- | 12000/- | 2375/- | 1170/- |

ට්‍රැක්ටරයක් ලබාගැනීම සඳහා සංවිධානයක් විසින් ප්‍රථමයෙන් ගෙවිය යුතු මූලික මුදල ට්‍රැක්ටරය ලබාදෙන මිලෙන් අටෙන් පංගුවක් පමණ වන ප්‍රමාණයකි.. එමෙන් ම ඉතිරි මුදල් ගෙවීම මාසික වාරික 35 කින් හෝ 47 කින් කළ හැක. ගොවීන්ගේ පහසුව සඳහා එම මුදල ගෙවීමටද තවත් පහසුකම් සළසා ඇත. එනම් යම් ගොවි සංවිධානයකට මාසයකට නියමිත වාරිකය ගෙවිය නොහැකි නම් කන්නය අවසානයේ දී අස්වැන්න නෙලා ගත් පසුව මාසික වාරික 6 ම එකවර ගෙවීමේ පහසුවද සපයා තිබීමයි. මෙම කාලය තුළදී ට්‍රැක්ටරයෙන් ලැබෙන ආදායම සංවිධානය විසින් ගොවිජන සේවා කමිටුවේ තැන්පත් කළ යුතුයි. මෙම වාර මුදල් සඳහා කිසිම පොළී මුදලක් හෝ අමතර අය කිරීමක් කරනු නොලබයි.

ට්‍රැක්ටර් සඳහා අවශ්‍ය අමතර කොටස් ද අවශ්‍ය ගොවි සංවිධාන වෙත අලෙවි කිරීමට ගොවිජන සේවා දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේ දී බලාපොරොත්තු වන අතර ප්‍රවාහන කටයුතු සඳහා ට්‍රේලර් සපයා දීමේ වැඩපිළිවෙලක් ද දැනට සකස් වෙමින් පවතී. ගොවි සංවිධානවල ප්‍රවාහන කටයුතු සඳහා මෙමගින් විශාල මෙහෙයක් ඉටුවේ. සංවිධානයේ ගොවීන්ට තමන්ට අවශ්‍ය පොහොර ප්‍රවාහනයද තම අස්වනු ප්‍රවාහනයද මෙමගින් අඩු වියදමකින් කරගත හැක . ට්‍රැක්ටර් ක්‍රියාකාරිත්ව හා නඩත්තුව පිළිබඳ පුහුණුව ගොවි සංවිධාන වලට ලබාදීමට ද දෙපාර්තමේන්තුව මගින් දැනටමත් පියවර ගෙන ඇත .

අත් ට්‍රැක්ටර් ලබාදීම සඳහා ගොවි සංවිධානයක් තෝරා ගන්නේ කෙසේ ද ?

- එම ගොවි සංවිධානය ගොවි සංවිධාන පිළිබඳ පනතේ අංක 56 ඒ හෝ 56 බී යටතේ ලියාපදිංචි වී තිබිය යුතු වේ .
- එය ක්‍රියාශීලි ගොවි සංවිධානයක් විය යුතුය .
- ට්‍රැක්ටරයේ වටිනාකම සඳහා වාරික මුදල් ගෙවීමට ගොවි සංවිධානයට හැකියාවක් තිබිය යුතුය.

දැනට අත් ට්‍රැක්ටර් ලබාගෙන ඇති සංවිධාන තම සාමාජික මහතුන්ගේ ගොවිතැන් කටයුතු සඳහා සහන අය කිරීම් මත ඒවා ලබාදෙයි . මෙතෙක් කලක් අධික මිලකට ට්‍රැක්ටර් සේවාව ලබාගත් ගොවීනට එය මහත් ආර්ථික වාසියකි. ට්‍රැක්ටරයෙන් ලැබෙන ආදායමෙන් වාර මුදල් ගෙවූ පසු ඉතිරි මුදල් ගොවි සංවිධානයේ අරමුදලට බැර කරන නිසා ඉන් සංවිධානයේ ආර්ථිකයද වර්ධනය වෙයි.

මෙම වැඩපිළිවෙලේ අනාගත අරමුණ වනුයේ දිවයිනේ සෑම ගොවි සංවිධානයකටම පාහේ ට්‍රැක්ටරයක් බැගින් හිමිකර දීමයි. ජල කලමණාකරණය පමණක් නොව කෘෂිකාර්මික සංවර්ධනයේ සෑම අංගයක් ම මනා ලෙස කිරීමට ශක්තිමත් ගොවි සංවිධාන තිබීම අත්‍යාවශ්‍ය වේ. එසේම ගොවීන් අතර හොඳ ක්‍රියාශීලී සංවිධාන ක්‍රමයක් පවතී නම් ට්‍රැක්ටර් ලබාදීම වැනි මෙවැනි සේවාවන්, සැපයීම පහසුවෙන් ක්‍රියාත්මක කිරීමට රජයටද හැකියාව ලැබේ . එමගින් ගොවි ආර්ථිකය නැංවීමට ලැබෙනුයේ විශාල පිටිවහලකි.

( ඉහත සංඛ්‍යාත්මක දත්ත ගොවිජන සේවා දෙපාර්තමේන්තුව ඇසුරෙනි.)